# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,218 — 1936ක්වූ මැයි මස 15 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

Matara, No. 46.—දකුණු දිසාවේ මාතර දිස්ත්‍රික්කේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1936ක්වූ ජූලි මස 2වෙනි දින පෙරවරු 10.30ට මාතර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ තිරවුල්කරදෙන්ට හෝ වෙනයම් අන්දමකින් දෙන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ මාතර දිස්ත්‍රික්කේ කන්දබඩපත්තුවේ සහ වැල්ලබඩපත්තුවේ පිහිටා තිබෙන බිම්කැබලි 14ක්.

අවසාන ගම් සිතියමේ නො. 166. ගම—පල්ලවෙල, කන්දබඩපත්තුව.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 139 | අටබෙහේන .. | මාතර පදිංචි මිසී වික්‍රමසූරිය හොනාමහත්මයා | කුරුඳු .. | 1 | 0 | 3 | 85 |
| 139A | පුවක්දෙලේහේන .. | එම .. .. | කුඹුර .. | 0 | 0 | 30 | 90 |
| 139C | කුරුඳුවත්ත .. | එම .. .. | රබර් .. | 0 | 1 | 31 | 85 |
| 139D | ඇටබෙහේන .. | එම .. .. | කුරුඳු .. | 0 | 0 | 7 | 85 |
| 193 | ගස්පහේදෙනිය .. | එම .. .. | පොල් .. | 0 | 0 | 5 | 85 |
| 25GA | එම .. | එම .. .. | වත්ත .. | 0 | 0 | 4 | 85 |
| 25GB | — .. | එම .. .. | වත්තට යනපාර .. | 0 | 0 | 6 | 85 |
| 25GC | ඇටබෙහේන .. | එම .. .. | කුරුඳු .. | 0 | 0 | 3 | 85 |

මුල් සිතියමේ නො. A 99. ගම—ඌරුගමුව නැගෙනහිර වැල්ලබඩපත්තුව.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගල්වැටේදෙනිය නොහොත් පීල්ල දෙනිය | ඌරුගමුවේ පදිංචි බී. ජී. සිංගිඅප්පු .. | කුඹුර .. | 0 | 1 | 4 | 170 |

මුල් සිතියමේ නො. A 149.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගිරිඋාවගෙවත්ත .. | ඌරුගමුවෙ නැගෙනහිර පදිංචි (1) ඩේවිඩ් බවාරිස්අමරසිංහ, (2) රදම්පොලගමගෙ දෙන් දවිත්, (3) හේවාපන්නිලගෙ දෙන් දියස්, (4) හේවාකොඩිතුවක්කුගෙ දෙන් අබරන්, (5) හේවාකොඩිතුවක්කුගෙ වත්තුහාමි, (6) හේවාකොඩිතුවක්කුගෙ දෙන් ජුවානිස්, (7) අමරසිංහ අර්නෝලිස්, (8) රදම්පොලගමගෙ දෙන් දියෝනිස්, (9) රදම්පොලගමගෙ මැනික්හාමි, (10) කහදගමගෙ හාමිනා සහ (11) ගලගම පදිංචි සල්මිනා රාජපක්ෂ | පොල් කොස් ආදිය.. | 0 | 1 | 9 | 85* |
| 4 | මුලුගහකොරටුව නොහොත් නාගහවත්ත නොහොත් ගිරිඋාවගෙවත්ත | එම .. .. | පොල් ආදිය .. | 2 | 3 | 2 | 85 |

මුල් සිතියමේ නො. A 181. ගම—කඩවැද්දුව, වැල්ලබඩපත්තුව.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | මහහේන .. | කඩවැද්දුව පදිංචි විලියම් විජේකෝන් .. | පැහිරි .. | 0 | 1 | 20 | 110 |

| නො. | ඉඩමේ නම. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| | | මුල් සිතියමේ නො. A 289. ගම—උඩඅපරැක්ක, වැල්ලබඩපත්තුව. | | | |
| 10 | අඟුරුකොටුවෙහේන .. | මාතර පදිංචි ජේ. පී. සෙනෙවිරත්න .. | පැඟිරි .. | 0 1 3 | 110 |
| | | මුල් සිතියමේ නො. 11,493. ගම—නාඹටුන්න, වැල්ලබඩපත්තුව | | | |
| 1 | හේනෙහගොඩගෙවත්ත. | නාඹටුන්නෙ පදිංචි විජේසේකර දොන් දියෝනිස් අබේගුනවර්ධන (ආණ්ඩුවට අයිති පලතුරු වලින් සහ බිමෙන් නොබෙදුනු 2/25 කොටස) | වත්ත .. | 1 1 20 | 210 |

* මෙම ඉඩම කලින් මිලයටගෙන නො. 4, 5, 6 සහ 7වෙනි අයිතිකාම කියාසිටින අයවලුන් විසින් ගෙවන්ට තිබෙන ඉතුරු මුදල නොගෙවනලද බැවින් නැවත ප්‍රසිද්ධකරනලදී.

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරනා මාතර උපඒජන්තතුමාගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල්තුමාගෙන්ද, ලබාගත හැකිය.

වර්ෂ 1936ක්වූ මැයි මස 13වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**Badulla, No. 161.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සදහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1936ක්වූ ජූලි මස 27වෙනි දිනවූ සඳුදා පෙරවරු 11ට බදුල්ල කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බිරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝජනාවා ඇත. ඌව දිසාවේ යටිකිද සහ බුත්තල කොරළයේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

මුල් ගම් සිතියමේ නො. A 53. ගම—යටිකිද පලාත පව්වෙපොල කෝරලේ අත්තනගොල්ල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 4 | ස්විත්වන්වත්ත .. | — .. | ආණ්ඩුව, සීමාසහිත ලංකාවේ ලුනුව හෝ සහ රබර්වතු සමාගම විසින් අයුත් හෝ බුත්ති විදිති | අවුරුදු 20ක් වයසැති සම්පූර්ණයෙන් හේ වවාපු ඉඩම | 1 1 25 | 90* |
| 5 | එම .. | — .. | එම .. .. | එම .. | 3 2 4 | 90* |

* නොම්මර 4 සහ 5 දරන ඉඩම් කැබලිදෙක සියට 75 අවුකර විකුනනු ලැබේ.

ඉහතකී ඉඩම් ගැන වැඩිදුර කාරණා ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1936ක්වූ මැයි මස 13වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**No. 11,884, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සදහන් වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1936ක්වූ ජූනි මස 27වෙනි දිනවූ සෙනසුරාදා පෙරවරු 9ට රම්බොඩගල්ලේ සැසිබංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බිරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝජනාවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ වැඩවිලිහත්පත්තුවේ මදුරකෝරළේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 4ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 807. ගම—කන්දෙගෙදර.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 7 | ඉහලවත්ත .. | රත්නායකමුදියන්සේලාගේ හිංගිරිඅම්මා .. .. | වත්ත .. | 0 3 17 |
| 16 | උඩවත්ත .. | නරසිංහමුදියන්සේලාගේ රණසිංහ බන්ඩා, (2) එම පුංචිබන්ඩා, (3) එම මුදියන්සේ | එම .. | 0 3 15 |
| 18 | ඊරිගහහේන .. | රත්නායකමුදියන්සේලාගේ පුංචිරාල .. .. | එම .. | 1 3 32 |
| 20 | එම .. | (1) එම ලොකුබංඩා, (2) එම පුංචිබන්ඩා .. .. | එම .. | 1 2 28 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බිරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1936ක්වූ මැයි මස 13වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**No. 11,885, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සදහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1936ක්වූ ජූනි මස 27වෙනි දිනවූ සෙනසුරාදා පෙරවරු 9ට රම්බොඩගල්ලේ සැසිබංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බිරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝජනාවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ වැඩවිලිහත්පත්තුවේ මාදුරකෝරළේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 6ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 806. ගම—උඩමුල්ල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 9 | කොරලන්දේවත්ත .. | මීරලෙබ්බේ වෙදගුරුන්නැහේ .. .. | වත්ත .. | 0 0 20 |
| 10 | පහලවත්ත .. | නැකැත්හේනයාගේ බයියා හේනයා .. .. | එම .. | 0 3 16 |
| 21 | ගුරුන්නැහේලාගේවත්ත | රත්නායකමුදියන්සේලාගේ පුංචිඅප්පුහාමි .. | එම .. | 0 1 17 |
| 23 | මුරුතගහමුලවත්ත .. | රත්නායකමුදියන්සේලාගේ උක්කුබන්ඩා, (2) එම උක්කුඅම්මා, (3) එම කිරිබන්ඩා, (4) එම කිරිමැණිකා, (5) එම වියරිබන්ඩා | එම .. | 0 3 21 |
| 27 | ඉහලවත්ත .. | හෙන්නකමුදියන්සේලාගේ පින්චිබන්ඩා, (2) එම කිරිබන්ඩා, (3) එම ලොකුබන්ඩා, (4) එම හිංගිරිබන්ඩා | එම .. | 0 2 22 |
| 38 | මීගහමුලවත්ත .. | බඩදුලාගේ කිරියා, (2) එම හව්හෙන්ද, (3) එම මැණිකි .. | එම .. | 0 3 9 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බිරුම්කරණ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1936ක්වූ මැයි මස 13වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

**No. 11,886, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1936ක්වූ ජූනි මස 27වෙනි දිනවූ සෙනසුරාදා පෙරවරු 9ට බලන්ගොඩ කානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ කඩවත්කෝරළේ උඩුවග්ගම්පත්තුවේ කොටසයේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 558. ගම—වලවේඅද්දර.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකම්කියන්නා. | අන්දම. | අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 17 | උඩහවත්ත .. | මොරහැල පදිංචි වෙයපිටිය කච්චඩියාලගේ හරමානිකා, (2) වලවේ අද්දර පදිංචි ජයසිංහ පේද්‍රිස් සිංඤෝ | හේන් .. | 2 | 0 | 32 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද ඒකේ සිතියම කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1936ක්වූ මැයි මස 13වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**No. 11,887, S. O.**—ඉඩම් බේරුම්කරණ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1936ක්වූ ජූනි මස 29වෙනි දිනවූ සඳුදා පෙරවරු 9ට බලන්ගොඩ කානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ කඩවත්කෝරළේ උඩුවග්ගම්පත්තුවේ කොටසයේ පිහිටා තිබෙන බිම්කැබලි 24ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 543. ගම—උඩගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකම්කියන්නා. | අන්දම. | අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 27 | නියකොලහේන .. | සුදුහකුරුගේ සිඤ්ඤෝ .. .. | හේන් .. | 6 | 2 | 31 |
| 35 | හෙල්වත්ත .. | ගුරුගේ අප්පුසිංඤෝ .. .. | එම .. | 2 | 3 | 29 |
| 39 | එම .. | එම .. .. .. | එම .. | 0 | 1 | 30 |
| 40 | පස්ගොඩගෙවත්ත .. | ගුරුගේ මල්ලිස්අප්පු .. .. | එම .. | 0 | 1 | 18 |
| 42 | පස්ගොඩගෙවත්ත හෙළේ වත්ත | පින්නවල පදිංචි ගුරුගේ මල්ලිස්අප්පු .. | හේන .. | 0 | 2 | 27 |
| 44 | කුඹුරේගොඩහේන හෙළේ වත්ත | සුදුහකුරුගේ බබානිකා .. .. | හේන් .. | 6 | 3 | 13 |
| 46 | ගෙවපල්ලේහේන .. | එම සිඤ්ඤෝ .. .. .. | එම .. | 8 | 0 | 38 |
| 57 | හෙල්වත්ත .. | ගුරුගේ මල්ලිස්අප්පු .. .. | එම .. | 2 | 1 | 16 |
| 64 | ගල්ඇන්දේවත්ත .. | කිතුල්ගස්ගමරාලලාගේ කිරිඅප්පුහාමි, (2) කිරිමැණිකා සහ තවත් අයවල් | එම .. | 0 | 2 | 12 |
| 66 | ගල්ඇන්දේහේන .. | බොල්තුඹේ පදිංචි හව්පේලියනගේ විලියම්සිංඤෝ .. | එම .. | 1 | 2 | 32 |
| 71 | ආරාවේගල්කොරටුව .. | කිතුල්ගස්ගමරාල්ලාගේ රතුන්හාමි .. .. | වත්ත .. | 0 | 1 | 15 |
| 85 | ආරාවේ අස්වැද්දුමේගොඩ වත්ත | අත්තනායකවිදානෙලාගේ බන්දුලහාමි .. | හේන් .. | 0 | 2 | 10 |
| 95 | හුලෙගහේන .. | කිතුල්ගස්ගමරාලලාගේ කිරිඅප්පුහාමි සහ ඔහුගේ සහෝදර සහෝදරියෝ, (2) කිරිමැණිකා | හේන් .. | 1 | 2 | 31 |
| 101 | ගෙවපල්ලේකොරටුව .. | අළුපොලකන්කානම්ලාගේ කිරිඅප්පුහාමි සහ ඔහුගේ සහෝදර සහෝදරියෝ | වත්ත .. | 0 | 1 | 19 |
| 102 | ගෙවපල්ලේඅරාව .. | අළුපොලකන්කානමලාගේ කිරිඅප්පුහාමි .. | එම .. | 0 | 0 | 6 |
| 105 | වැටකොලුලන්ද .. | උඩම පදිංචි සිංගප්පුලිවතුකාරගේ දිනෝරිස් .. | හේන් .. | 17 | 2 | 10 |
| 107 | බෝගහහේන .. | අමරකෝන්මුදියන්සේලාගේ හීන්මැණිකා, (2) ඒ. මන යාකනොහොවිටාලලාගේ කුඩාමහත්මයා | හේන .. | 2 | 2 | 24 |
| 111 | අලකොරටුවේවත්ත .. | උඩගම පදිංචි ගොඩගේ දෙන් නන්දිස්හාමි .. | හේන් .. | 0 | 3 | 18 |
| 126 | වැටකොලුලන්ද .. | බලන්ගොඩ පදිංචි ජේ. ඇම්. සියනේරිස් .. | එම .. | 23 | 2 | 1 |
| 128 | වෑවගාවකොරටුව .. | මුනසින්දුරගේ කිරිමැණිකා .. .. | වත්ත .. | 0 | 1 | 4 |
| 129 | එම .. | එම .. .. .. | එම .. | 0 | 0 | 37 |
| 137 | අගලදඩුවත්ත .. | වල්බොඩගෙදර කිරිබන්ඩා .. .. | හේන් .. | 0 | 1 | 34 |
| 144 | බිදුල්ලේහේනේවත්ත .. | උඩගම පදිංචි කඩුක්කන්මාන්නගේ ජීම්සා .. | එම .. | 0 | 1 | 24 |
| 147 | දුනුම්බලගහවත්ත වැව කොලුලන්ද | උඩගම පදිංචි සිංගප්පුලිවතුකාරගේ දිනෝරිස් . | හේන් .. | 3 | 1 | 7 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1936ක්වූ මැයි මස 13වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**No. 11,888, S. O.**—ඉඩම් නිරවුල්කරණ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1936ක්වූ ජූනි මස 30වෙනි දිනවූ අඟහරුවාදා පෙරවරු 9ට බලන්ගොඩ කානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ කඩවත්කෝරළේ උඩුවග්ගම්පත්තුවේ කොටසයේ පිහිටා තිබෙන බිම්කැබලි 23ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 543. ගම—උඩගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකම්කියන්නා. | අන්දම. | අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 155 | දෙනෙගම්ගෙදරවත්ත | ලංකා සීමා සහිත අප්ලන්ඩ්ස් තේවතු සමාගම (කොළඹ මිටෝල් සහ සමාගමේ මහතුන් ඒජන්තවරු) සහ තවත් අයවල් | වත්ත .. | 0 | 2 | 12 |
| 160 | පින්නගෙදරවත්ත .. | බොල්තුඩේ පදිංචි ආර්. ඇම්. පුංචිබන්ඩා සහ ඔහුගේ සහෝදරයා සහ සහෝදරී | හේන් .. | 2 | 1 | 32 |
| 166 | වදකහඅරාවේවත්ත .. | සමරසිංහමුදියන්සේලාගේ කිරි කුමාරිහාමි, (2) අමුනේතැන්නේ මුදියන්සේලාගේ පුංචිමැණිකෙ | එම .. | 0 | 2 | 17 |
| 167 | එම .. | ගොඩගේ දෙන් චාර්ලිස් සිංඤෝ, (2) එම ආයිරිස්අප්පු | එම .. | 1 | 0 | 25 |
| 168 | දිමියන්ගස්ඇලෙවත්ත | උඩගම පදිංචි අතුකෝරාලලාගේ ජේම්ස් අප්පුහාමි .. | රබර් .. | 1 | 2 | 31 |
| 170 | වදකහඅරාවේහේන .. | වැව්ගලමුදියන්සේලාගේ ජයතිලක බන්ඩා, (2) එම ගුණසේකර බන්ඩා, (3) එම විජේරත්නබන්ඩා, (4) එම කිරිබන්ඩා, (5) කිරිකුමාරිහාමි, (6) එම ප්‍රභාවතී කුමාරිහාමි | හේන .. | 0 | 3 | 21 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකම්කියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 171 | දිමියන්ගස්අැලේවත්ත | බස්නායකමුදියන්සේලාගේ සිරිපිනායක, (2) බී. ගුණසේකර, (3) බී. මහින්දසෝම, (4) බී. ධම්මරත්න | හේන් .. | 2 | 3 | 31 |
| 172 | දිමියන්ගස්ඇල්ල, දිමියන්ගස්ඇල්ලේවත්ත | බස්නායකමුදියන්සේලාගේ මහින්දසෝමා, (2) බී. ධම්මරත්නබණ්ඩා, (3) බී. ඇම්. කිත්තිනායකගේ උරුමක්කාරයෝ | එම .. | 0 | 2 | 21 |
| 178 | කොලොන්ගහවත්ත | මාතෙනාටගමරාලගේ පින්හාමි ආරච්චි .. .. | එම .. | 0 | 2 | 36 |
| 179 | මීගහවත්ත .. | උඩගම පදිංචි එම කිරිඅප්පුහාමි .. .. | වත්ත .. | 0 | 0 | 24 |
| 181 | එම .. | එම අබුසදහාමි .. .. .. | එම .. | 0 | 1 | 7 |
| 185 | පිටතලාවේවත්ත .. | කන්දේදුරගේ කිරිබබා, (2) වෙයනගේ ඩිංගිරි .. | හේන් .. | 2 | 2 | 21 |
| 186 | මීගහවත්ත .. | මාතෙනාටගමරාලගේ අබුසදහාමි .. .. | හේන .. | 0 | 3 | 3 |
| 197 | දිමියන්ගස්ඇල්ලේ හේන | බොල්තුඹේ බස්නායකමුදියන්සේලාගේ ලීලාවතී කුමාරිහාමි, (2) කරුණාවතීකුමාරිහාමි, (3) ධම්මරත්නබණ්ඩා | එම .. | 0 | 2 | 38 |
| 198 | දිමියන්ගස්ඇලේවත්ත | බස්නායකමුදියන්සේලාගේ කීර්තිනායකගේ උරුමක්කාරයින්වන (1) එම අමරසිංහ, (2) එම කුසුමාවතී, (3) එම සෝමාවතී, (4) එම රොබට් ගුණපාල, (5) අබේකෝන්මුදියන්සේලාගේ ධම්මවාරී කුමාරිහාමි (ලාබාල දරුවන්ගේ භාරකාරතැන) සහ අනිත් අයිතිකාරයින්වන, (6) එම ධම්මරත්න, (7) එම ගුණසේකර, (8) එම මහින්දසෝමා | හේන් .. | 0 | 1 | 6 |
| 199 | දිමියන්ගස්ඇල්ල .. | බස්නායකමුදියන්සේලාගේ ගුණසේකර, (2) එම ධම්මරත්න .. | එම .. | 0 | 1 | 0 |
| 200 | එම .. | හව්පේලියනගේ විලියම්සිංඤෝ .. .. | එම .. | 1 | 0 | 31 |
| 201 | තැන්නේපිටවත්ත .. | උඩගම පදිංචි ඒ. ඩබ්ලිව්. කාවර් .. .. | වත්ත .. | 0 | 1 | 38 |
| 203 | එම .. | උඩගම කිරිපත්දෙනියේ පදිංචි අහන්ගන්ගොඩ ආචාරිගේ චාර්ලිස් ද සිල්වා | හේන් .. | 0 | 3 | 5 |
| 205 | දිමියන්ගස්ඇලේවත්ත | නැසීගිය බස්නායකමුදියන්සේලාගේ කීර්තිනායකගේ උරුමක්කාරයින්වන (1A) එම අමරසිංහ, (1B) එම. කුසුමාවතී, (1C) එම සෝමාවතී, (1D) එම රොබට් ගුණපාල සහ වෙනත් අයිතිකම්කියන්නන්වූ (2) එම ධම්මරත්න, (3) එම ගුණසේකර, (4) එම මහින්දසෝම | එම .. | 1 | 1 | 5 |
| 207 | අඹුන්නේවත්ත .. | දකුණු කළුතර "ඕර්නන්" වත්ත හිමිකාරයාවූ අයි. ඇම්. ඕර් නෝනා විසින් වඩ්ඩුරඅල්ලාගෙන තිබෙන බිම | රබර් .. | 0 | 1 | 24 |
| 213 | එම .. | කළුතර ඕර්නන්වත්ත අයිතිකාරියවූ අයි. ඇම්. ඕර් නෝනා .. | එම .. | 0 | 0 | 14 |
| 119 | දිමියන්ගස්ඇල්ල, පාරගස්දෙනියේවත්ත | හව්පේලියනගේ විලියම් සිංඤෝ .. .. | හේන් .. | 6 | 3 | 4 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1936ක්වූ මැයි මස 13වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නො. 3 වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට එනම්:—මීගමුවේ අසරප්පාලේන්එක පලල්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876 යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රණසභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරීතිබෙන බලයපිට නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම් :—

සිතියමේ නො. A 516. ගම—වැල්ලවීදිය, මීගමුව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | වරිපනම් නො. 254ඒ ඉඩමේ කොටසක්, වැල්ලවීදිය | ඉස්තෝප්පුවක් සහ මේසන්වැඩ කරනලද පඩිවලින් යුත් උළු සෙවිලි මේසන්වැඩ කරනලද ගෙයක් | මේරී ජෝසපින් පුල්ලේ නෝනා සහ මිනුවල් ජෝසප් නිකලස් පුල්ලේ, අසරප්පාලේන් | 0 | 0 | 2·35 |
| 2 | පන්තිච්චාමරතඩිතෝටම්, වරිපනම් නො. 254ඒ ඉඩමේ කොටසක්, වැල්ලවීදිය | වත්ත (වැටිල්ලක් නැත) .. | එම .. | 0 | 0 | 1·28 |
| 3 | වරිපනම් නො. 52ඒ ඉඩම, හරිවීදිය | කුඩා ගෙවල් 3කින්යුත් මේසන් වැඩකරන ලද උළුසෙවිලි කඩයක්ද, පඩියක් සහ ඉස්තෝප්පුවක්ද, අතු සෙවිලි මඩුවක්ද, පැලඟහි වැටක්ද, අවුරුදු 5ක් වයස මුරුන්ගාගස් 3ක් සහ ඉලෙක්ට්‍රික් කනුවකින් යුත් ඉඩම | මීගමුවේ වැල්ලවීදියේ රෝමානු කතෝලික සභාව, කොළඹ රෝමානු කතෝලික අග්‍ර ගුරුප්‍රසාදීන් වහන්සේ බාරේ | 0 | 0 | 4·25 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම දෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1936ක්වූ ජූනි මස 29වෙනි දින පෙරවරු 10යේ කාලයට මීගමුවේ යූ. ඩී. සී. කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1936ක්වූ මැයි මස 11වෙනි දින කොළඹ කච්චේරියේදීය.

කාල් ඊ. ආන්ඩි,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුවට.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට; එනම්:—කඳුවලවත්තට සහ බිහිරි අන්ධ ස්කෝලයට විදුලිබලය බෙදාදෙන ශාඛා ස්ථානයකට මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත්ආණ්ඩු කාරකමන්ත්‍රන සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලයපිට නිසිආකාර මට අණ ලැබිතිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 401. ගම—දකුණු රත්මලාන.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | කඳුවලවත්ත | කුරුඳුපඳුරු 21ක්ද, කජුගස් 2ක්ද, ගෝරකගහක්ද, විදුලිබලය පරීක්ෂන යකඩපෙට්ටියක් සහ යකඩ විදුලිකනු දෙකකින් යුත් කුරුඳු ඉඩම | ඇන්. ඩී. එච්. අබ්දුල්කාදර්, නො. 532, ගාලුපාර, කොල්ලුපිටිය | 0 | 0 | 21·3 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැම්දෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1936ක්වූ ජූනි මස 30වෙනි දින පෙරවරු 10යේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලා සිටින මුදල් ගනනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1936ක්වූ මැයි මස 11වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ඇස්. ඇෆ්. අමරසිංහ,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—පැරණි රජමාලිගාව පිහිටි ස්ථානය ප්‍රවේසම්කරගැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනිකාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 312. ගම—මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ පාතදුම්බර උඩගම්පහ කෝරලේ කුණ්ඩසාලේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත, අ. | රූ. | ප |
|---|---|---|---|---|---|---|
| 1 | කුණ්ඩසාලේවත්ත | අවුරුදු 15ක් පමණ වයසැති කොකොවා ගස් 2ක් තිබෙන කොකොවා වත්තේ කොටසක් | "ඇන්ග්ලෝ සිලෝන් ජනරල් ඇස්ටේට්ස්" නමැති සීමාසහිත සමාගම, ඒජන්තවරු, කොළඹ සීමාසහිත "බොයිස් බ්‍රදර්ස්" සමාගම | 0 | 0 | 6 |
| 2 | පොල්වත්ත .. | අවුරුදු 50ක් පමණ වයසැති පොල්ගස් 48ක් තිබෙන පොල්වත්තේ කොටසක් | සී. එච්. සෝමර්ස් (ලාබාලයා), බාරකාරී, බදුල්ලේ ඇල්ලදූවේ සෝමර්ස් නෝනා | 0 | 2 | 16·9 |
| 3 | ගබඩාවේවත්ත .. | අවුරුදු 50ක් පමණ වයසැති පොල්ගස් 2ක් තිබෙන වත්ත | තෙල්දෙණියේ හෙනගැහුවෙල පදිංචි වැලාවත්තේ මුදියන්සේලාගේ ඩිකිරි බණ්ඩා සහ වැල්ලවත්තේ මුදියන්සේලාගේ රන්මැනිකා | 0 | 0 | 16·7 |
| 5 | පොල්වත්ත .. | අවුරුදු 20 සිට 50 දක්වා වයසැති පොල්ගස් 425ක්, අවුරුදු 25 සිට 50 දක්වා වයසැති කොස්ගස් 6ක්, අවුරුදු 20ක් පමණ වයසැති කොකොවාගස් 26ක්, අවුරුදු 10ක් වයසැති දෙල්ගස් 13ක්, අවුරුදු 10ක් පමණ වයසැති බිලිංගස් 2ක් සහ අඹගස් 6ක් සහ ගලේ කෙටූ සඳකඩ පහනක සල කුහක්ද තිබෙන පොල්වත්තේ කොටසක් | සී. එච්. සෝමර්ස් (ලාබාලයා), බාරකාරී, බදුල්ලේ ඇල්ලදූවේ සෝමර්ස් නෝනා | 7 | 1 | 22·3 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකරතිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1936ක්වූ ජූනි මස 15වෙනි දින පෙරවරු 10යේ කනිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1936ක්වූ මැයි මස 11වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ආර්. මොහිපෙති,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—නෝර්ටන්-ලූකම්බ්පාර සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවන් කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 17. ගම—මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ අඹගමුව කෝරලේ මස්කෙලිය සහ හාර්නිෂ්.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | ලක්ෂපානගල-කලේවත්ත සහ නෙබර්ටන් වතුමැදින් යන නෝර්ටන්-ලූකම්බ්පාර | පී. ඩබ්ලිව්. ඩී. පාර | "ද නෙබර්ටන් සිලෝන් ටී" නමැති සීමා සහිත වතු සමාගම, ඒජන්තවරු, සීමා සහිත "ගෝර්ඩන් ප්‍රේසර්" මහතුන්ගේ සමාගම | 5 | 1 | 15·9 |
| 3 | නෙබර්ටන් වත්ත මැදින් යන නෝර්ටන්-ලූකම්බ්පාර | එම .. | එම .. .. | 0 | 1 | 3·1 |
| 5 | හපුගස් තැන්න මැදින් යන නෝර්ටන්-ලූකම්බ්පාර | එම .. | ලන්ඩන්නුවර 'ජන්සි' තේ සමිතිය, ඒජන්තවරු, සීමා සහිත කාර්සන් සමාගමේ මහත්වරු | 0 | 3 | 12·7 |
| 8 | එම .. | එම .. | එම .. .. | 0 | 0 | 7·7 |
| 9 | එම .. | එම .. | එම .. .. | 0 | 0 | 2·3 |
| 10 | එම .. | එම .. | එම .. .. | 0 | 0 | 2·6 |
| 12 | එම .. | එම .. | එම .. .. | 3 | 1 | 31·2 |
| 13 | හපුගස්තැන්නවත්ත .. | අවුරුදු 15 සිට 20 දක්වා වයසැති තේපදුරු 34ක් තිබෙන් | එම .. .. | 0 | 0 | 5·7 |
| 14 | ලූකම්බ්වත්ත මැදින් යන නෝර්ටන්-ලූකම්බ්පාර | පී. ඩබ්ලිව්. ඩී. පාර | සීමා සහිත ලංකාවේ "එලයන්ස් ටී" නමැති සමාගම, ඒජන්තවරු, විටෝල් සමාගම | 4 | 0 | 16·3 |
| 15 | නෝර්ටන්-ලූකම්බ්පාර .. | එම .. | සීමා සහිත ලංකාවේ "ද නියන්සා ටී" නමැති සමාගම, ඒජන්තවරු, සීමා සහිත ලූෂි බ්‍රවුන් සමාගම | 0 | 1 | 11·2 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1936ක්වූ ජූනි මස 20වෙනි දින පෙරවරු 10යේ කනිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1936ක්වූ මැයි මස 11වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ආර්. මොහිපෙති,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3න් ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—පල්ලේබාගේට සෙකෝලයක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

නොම්මර 117 දරණ අවසාන ගම් සිතියමේ නොම්මර 1 දරණ අතිරේක සිතියම. ගම—මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩබුලත්ගම අඹගමුව කෝරළේ හිට්ටියෙග්ගම (කොටසක්).

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 66 | වීවැඩළනුගෙන්න .. | අවුරුදු 30ක් වයසැති කොස්ගහක්, තගරන් සෙවිලිකරතිබෙන වරිච්චි බිත්ති සහිත සෙකෝලයක්, පොල්අතු සෙවිලිකර ලෑලිවලින් සාද තිබෙන බිත්ති සහිත මැසිකිලි 2ක් සහ පොල් අතු සෙවිලිකර වරිච්චි බිත්ති සහිත මැසිකිලි එකක්ද තිබෙන හේන | නාවලපිටියේ ඇලැක්සැන්ඩර් මාරගේ සහ හගරාපිටියේ අට්ටාලගමරාලලාගේ කිරි අප්පු | 1 2 29·7 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1936ක්වූ ජූනි මස 20වෙනි දින පෙරවරු 10.30ගේ කණිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1936ක්වූ මැයි මස 11වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ආර්. මොන්පෙනි,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3න් ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කටුපිටිය–දම්බොක්ක පාරේ නොම්මර 5/2 පාලම සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

නොම්මර A 442 දරණ මුල් සිතියම. ගම—වයඹදිශාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැළඹවිල්ලි හත්පත්තුවේ තිරගන්දගේ නැගෙනහිර කෝරළේ කටුපිටිය.

| නො. | ඉඩමේනම. | අන්දම. | අයිතිකාමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පරගහපිටියකුඹුර .. | කුඹුර .. | කටුපිටියේ පදිංචි වී. බී. රත්නායක සහ ඩබ්ලිව්. බී. කටුපිටිය මහතුන් | 0 0 25·8 |
| 3 | කුරුකොස්ගහලන්දේවත්ත .. | පොල්වත්ත .. | එම .. .. .. | 0 0 14·5 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1936ක්වූ ජූලි මස 3වෙනි දින පෙරවරු 10ගේ කණිසමට කුරුණෑගල කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1936ක්වූ මැයි මස 9වෙනි දින
කුරුණෑගල කච්චේරියේදීය.

එච්. සී. කොක්ස්,
වයඹ දිශාවේ කුරුණෑගල දිස්ත්‍රික්කුවේ ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

## ඉඩම් නැවත රජසන්තක කරගැනීමේ දැන්වීම.

උතුරු පලාතේ යාපනේ දිස්ත්‍රික්කේ වඩමරච්චි කොඨාසයේ නාගර් කෝවිල් යන ගමේ පිහිටි මීට යාකරතිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ආණ්ඩුව විසින් හෝ වෙනුවෙන් දී තිබෙන බිම්කට්ටිය දැනට අට අවුරුද්දකට වැඩි කාලයක් අයිතිකාරයින් විසින් අත්හැරදමා තිබෙන බව උතුරු පලාතේ ඒජන්තතුමාට පෙනීයන බැවින්ද;

උතුරු පලාතේ ඒජන්තතුමා විසින් මේ ගැන ඉතා ඕනෑකමින් සෑහෙන පමණ විභාගකළේවීනමුත් එබඳු අයිතිකාරයන් හෝ ඔවුන් වෙනුවෙන් නීතිප්‍රකාර අයිතිවාසිකම් කියන යම් කෙනෙකු දැනගන්ට නොමැති බැවින්ද;

මේ ඉඩමට අයිතිවාසිකම් ඔප්පුකරන්ට පුළුවන් අයෙක් හෝ ඒ වෙනුවෙන් යමෙක් විසින් වර්ෂ 1936ක්වූ ජූනි මස 1වෙනි දින පටන් මාස 12ක කාලයක් තුළ අයිතිවාසිකම් නොපෙන්නා සිටියොත් එකී ඉඩම වර්ෂ 1887ගේ ඉඩම් නැවත රජසන්තක කරගැනීමේ ආඥාපණතේ 2වෙනි වගන්තිය යටතේ නැවත රජසන්තකකරගන්නාබව ඉහතකී ආඥාපණතෙන් උතුරු පලාතේ ආණ්ඩුවේ ඒජන්තතුමාට ලැබී තිබෙන බල ප්‍රකාර ආණ්ඩුකාර උතුමානන්වහන්සේගේ අවසරයත් ඇතිව ප්‍රකාශ කරන බව සම්බන්ධවූ සියලුදෙනාම මෙයින් දැනගනිත්වා.

1936ක්වූ මැයි මස 1වෙනි දින
යාපනේ කච්චේරියේදීය.

ඡ්. ඊ. මෙඩසන්,
උතුරු පලාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා.

### උප ලේඛනය.

යාපනේ දිස්ත්‍රික්කේ වඩමරච්චි කොඨාසයේ කච්කොවලම් යන ගමේ පිහිටි නො. 2,227 දරන ප්‍රාරම්භ සිතියමේ (නො. 187,570 දරන නාම සිතියම) නො. 8,175 දරන බිම්කට්ටිය වශයෙන් පෙන්නුම්කර තිබෙන රූඩ්ස් 3යි පර්චස් 36ක් ප්‍රමාණ ඇති අයියන්කෝයිල්වෙලි යන ඉඩම.

මීට මායිම්:—උතුරට: ආණ්ඩුව අයිතිවාසිකම් කියාසිටින අයියන්කෝවිල්වෙලි.

නැගෙනහිරට: ආණ්ඩුව අයිතිවාසිකම්කියාසිටින අයියන්කෝවිල්වෙලි.

දකුණට: කදිරමර් ඩේවිඩ් සින්නතම්බි සහ තවත් අයින් අයිතිවාසිකම්කියාසිටින අයියන්කෝවිල්වෙලි (නො. 187,392 දරන නාම සිතියම).

බස්නාහිරට: ආණ්ඩුව අයිතිවාසිකම් කියාසිටින අයියන්කෝයිල්වෙලි.

---

## ඉඩම් නැවත රජසන්තක කරගැනීමේ දැන්වීමයි.

උතුරු පලාතේ යාපනේ දිස්ත්‍රික්කේ වඩමරච්චි කොඨාසයේ නාගර් කෝවිල් යන ගමේ පිහිටි මීට යාකරතිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ආණ්ඩුව විසින් හෝ වෙනුවෙන් දී තිබෙන බිම්කට්ටිය දැනට අට අවුරුද්දකට වැඩි කාලයක් අයිතිකාරයින් විසින් අත්හැරදමා තිබෙන බව උතුරු පලාතේ ඒජන්තතුමාට පෙනීයන බැවින්ද;

උතුරු පලාතේ ඒජන්තතුමා විසින් මේ ගැන ඉතා ඕනෑකමින් සෑහෙන පමණ විභාගකළේවීනමුත් එබඳු අයිතිකාරයන් හෝ ඔවුන් වෙනුවෙන් නීතිප්‍රකාර අයිතිවාසිකම් කියන යම් කෙනෙකු දැනගන්ට නොමැති බැවින්ද;

මේ ඉඩමට අයිතිවාසිකම් ඔප්පුකරන්ට පුළුවන් අයෙක් හෝ ඒ වෙනුවෙන් යමෙක් විසින් වර්ෂ 1936ක්වූ ජූනි මස 1වෙනි දින පටන් මාස 12ක කාලයක් තුළ අයිතිවාසිකම් නොපෙන්නා සිටියොත් එකී ඉඩම වර්ෂ 1887තේ ඉඩම් නැවත රජයන්තක කරගැනීමේ ආඥාපණතේ 2වෙනි වගන්තිය යටතේ නැවත රජයන්තකකරගන්නා බව ඉහතක් ආඥාපණතෙන් උතුරු පලාතේ ආණ්ඩුවේ ඒජන්තතුමාට ලැබීතිබෙන බල ප්‍රකාර ආණ්ඩුකාර උතුමානන්වහන්සේගේ අවසරයත් ඇතිව ප්‍රකාශකරන බව සම්බන්ධවූ සියලුදෙනාම මෙයින් දැනගනිත්වා.

1936ක්වූ මැයි මස 1වෙනි දින
යාපනේ කච්චේරියේදීය.

ජ්. ඩී. ඩෙඩසන්,
උතුරු පලාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා.

උප ලේඛනය.

යාපනේ දිස්ත්‍රික්කේ වඩමරච්චි කොට්ඨාසයේ කච්චෝවලම් යන ගමේ පිහිටි නො. 2,227 දරන ප්‍රාරම්භ සිතියමේ (නො. 187,568 දරන නාම සිතියම) නො. 8,171 දරන බිම්කට්ටිය වශයෙන් පෙන්නුම්කර තිබෙන අක්කර එකක් පමණ ප්‍රමාන ඇති අයියන්කෝවිල්වෙළි සහ ඉඩමෙන් කොටසක්.

මීට මායිම් :—උතුරට: වැලිපාර (නො. A 487 දරන ප්‍රාරම්භ සිතියමේ නො. 4 දරන බිම්කට්ටිය).

නැගෙනහිරට: කේ. මුත්තුකුමාරු අයිතිවාසිකම්කියා සිටින ඉඩම.

දකුනට: ආණ්ඩුව විසින් අයිතිවාසිකම්කියා සිටින අයියන්කෝවිල්වෙලි යන ඉඩම.

බස්නාහිරට: නැසීගිය නාකප්පර්වල්ලිපුරම්ගේ උරුමක්කාරයින් අයිතිවාසිකම් කියාසිටින ඉඩ .

## මැණ්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

මෙහි පහත සඳහන්වෙන පුත්තලම සහ හලාවත දිස්ත්‍රික්කුවල පාලම් සහ ඇලරේන්ද වර්ෂ 1936ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් වර්ෂ 1937ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා දෙළොස් මාසයකට ආණ්ඩුවෙන් බදුගැනීමට එවන ලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර පුත්තලමේ උප ඒජන්ත උන්නාන්සේ විසින් භාරගනු ලැබේ.

2. පෙරකී මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර පිටපිට හෙවත් ඇන්විලොප් උඩ "Tender for Toll Rents" රේන්ද සඳහා ඉල්ලුම් පත්‍ර යන වාසගම ඇතුව වර්ෂ 1936ක්වූ ජූනි මස 18වෙනි දින දවල් 10ට පුත්තලම් කච්චේරියේදී භාරගනු ලැබේ. ඉල්ලුම්කාරයෝම පෙනීසිට ඔවුන්ගේම අතින් ඉල්ලුම්පත්‍ර භාරදෙන්ට ඕනෑය. තැපැල් මගින් එවනලද ඉල්ලුම්පත්‍ර හෝ මතු පෙනෙන වේලාවට පසු එවනලද ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ.

3. ඒ ඒ රේන්දපලවල්වලට වෙන් වෙන් වශයෙන් ඉල්ලුම්පත්‍ර දෙන්ට ඕනෑය.

4. උප ඒජන්ත උන්නාන්සේ විසින් උතුමාණන්වහන්සේගේ ඔප්පුකර සිටීමට තෝරාගන්නාලද ඉල්ලුම්පත්‍රය අයිතිකාරයා විසින් ඉල්ලාපු ගණනින් දහයෙන් කොටසකට වැට සෙන මුදල් ගණන සල්ලිවලින් වහාම ඇප තබන්ට ඕනෑවා පමණකුත් නොව එම ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින් භාරගන්ට යෙදුනිනම් ඒ බව දැනුම්දෙන දින සිට 30 දවසක් ඇතුළතදී එම ඉල්ලූ ගණනින් දෙකෙන් පංගුවකට වටිනා ඇප ඒත්තුගත් මුද්‍ර ඔප්පුවලින් හෝ තුනෙන් කොටසකට වටිනා ඇප මුදලෙන් හෝ තිබා සම්පූර්ණකරන්ට ඕනෑය.

5. ඇප පිණිස තබනලද ඔප්පු සෝදිසිකිරීමට සහ ඔප්පුවල සඳහන් ඇප ඉඩම් ගැන අදහස ප්‍රකාශකිරීමටද ආණ්ඩුවේ පෙරකදෝරු උන්නාන්සේට ගෙවියයුතු ගාස්තුද, එසේම ඇප ඔප්පු ලිවීමට සහ ඒවා සම්පූර්ණ කිරීමටද වර්ෂ 1919යේ නො. 10යේ රෙගුලාසිය යටතේ ගෙවියයුතු ඔප්පුවලට මුද්දර ගාස්තුද යන සියල්ලම ගෙවීම පිණිස මුදල් බඳින්ට ඕනෑය.

6. ඇප වෙනුවෙන් තබනලද ඉඩම්වල ඔප්පු, ඒවා මීට ප්‍රථම ඇපෙකට නොහොත් උකසකට යටත් නැතිබවට ඉඩම් ලියා පදිංචිකරණ රෙජිස්ත්‍රාර්තුමාගෙන් සහතිකපත්‍රයක් ලබාගත යුතුයි. මේ සහතිකපත්‍ර ලබාගැනීමට ඕනෑකරණ වියදම ඇප තබන අය විසින්ම දැරියයුතුයි.

7. කිසිම හෝ නොහොත් සියලුම ඉල්ලුම්පත්‍ර ප්‍රශනයනොකර එපා කිරීමට බලයක් උප ඒජන්ත උන්නාන්සේට තබාගනු ලැබේ.

වැඩිදුර කාරණ පුත්තලමේ උප ඒජන්ත උන්නාන්සේගෙන් ඉල්ලුම්කළවිට දැනගත හැක.

ඇල රේන්ද.

1. නාත්තන්ඩිය | 2. වුනාතිපිරවු | 3. පාලාවිය

තොටුපල් රේන්ද.

1. පුත්තලම-ඒතාලේ
2. පුත්තලම-කල්පිටිය
3. කල්පිටිය-කරතිව්
4. කල්පිටිය-මුටුවෝල්
5. හලාවත-මුටුවෝල්

ඒ. ඒ. ක්‍රිස්ටෝපල්ස්,
පුත්තලම්-හලාවත දිස්ත්‍රික්කවල උප ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1936ක්වූ මැයි මස 8වෙනි දින
පුත්තලම් කච්චේරියේදීය.

## අනතු. දැන්වීම.

1907තේ අවුරුද්දේ 1වෙනි රෙගුලාසියේ 8වෙනි වගන්තියේ 1වෙනි පෙළේ B අක්ෂරය දරණ වගන්තිය පිට දැන්වීමයි.

මෙහි පහත අත්සන්කරණ මඩකලපුවේ තාමරකනියේ පදිංචි පොන්නයියා කන්‍දයියා වන මා මඩකලපු දිස්ත්‍රික්කයේ දෙමළ භාෂාවෙන් වැඩකරණ නොතාරිස් කෙනෙක්ව පත්කරණලෙස 1936ක්වූ ජූලි මස 11වෙනි දිනට පසුවූතැන ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාවෙත අයදුම්පතක් යැවීමට අදහස්කරගත්බව මෙයින් මහජනයාට දැනුම්දෙමි.

තාමරකේනි, මඩකලපුව.
8. 4. 36.

මීට,
පී. කන්‍දයියා.